පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

9 ශ්‍රේණිය

සතිය- පළමු සතිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

- *මේ කාලය තුළ සෑම විෂයක්ම පුණරීක්ෂණයේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු වළ නිරතවීම ඔබගේ වගකීමකි.*
- *පළමු පාඩම මේ වන විට ඔබට උගන්වා අවසන් වී ඇති අතර පළමු පාඩමට අදාල කියවීම් පොත, වැඩපොත හා ඔබගේ අභ්‍යාස පොත අධ්‍යයනය කර පහත ක්‍රියාකාරකම් වල නිරතවන්න.*
- *මෙම කාර්යය සඳහා ඔබට සතියක කාලයක් ලැබේ.*

*ඔබේ පිළිතුරු හෝ නිර්මාණ **<u>පළමු සතිය-ICT- ඔබේ නම හා ශ්‍රේණිය</u>** ලියන ලද අමුණන ලද ගොනුවක් සේ සකස්කරන්න.*

01 පරිගණක සහ පර්යන්ත උපාංග මිලදී ගැනීම සඳහා පිරිවිතර සැකසීම පාඩමෙහි පෙළ පොතෙහි පිටු අංක 1 සිට 4 දක්වා කියවීමෙන් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ සිටින එක් එක් පරිශීලකයා තම පුද්ගල පරිගණකය යොදා ගන්නා කාර්යය අනුව විශේෂිත නාමයකින් හඳුනවනු ලැබේ. එවැනි කාර්යය හා පරිශීලක නාම කිහපයක් පහත සඳහන් වගුවෙහි ඇත. එම **කාර්යය** හා **පුද්ගලයා හඳුන්වන නාමය** යන තීරු නිවැරදිව ගලපන්න.

| පුද්ගලයා හඳුන්වන නාමය | කාර්යය |
|---|---|
| ක්‍රමලේඛක (Programmer) | වෙබ් අඩවි නිර්මාණය හා සැලසුම් කිරීම |
| ජාල පරිපාලක (network administrator) | මෘදුකාංග නිර්මාණය කිරීම |
| පද්ධති විස්ලේෂක (System analyst) | පරිගණක ජාල පරිපාලනය හා නඩත්තුව |
| මෘදුකාංග ඉංජිනේරු (software engineer) | පරිගණක ක්‍රමලේඛ සංවර්ධනය |
| පරිගණක යෙදුම් සහායක (computer application assistant) | තොරතුරු පද්ධති සැලසුම් කිරීම |
| වෙබ් සංවර්ධක (web developer) | යතුරු ලියනය, පරිගණක ආශ්‍රිත නිර්මාණය සහ සංස්කරණය (ලිපි ලේඛන,රූප, ශබ්ද, වීඩියෝ ආදිය) |

02 **පහත ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සුදුසුම පරිගණක වර්ගය පහත සඳහන් ලැයිස්තුවෙන් තෝරා ලියන්න.**

(මේස පරිගණකය, උකුල් පරිගණකය, සුහුරු ජංගම දුරකතනය, සේවාදායක පරිගණකය, ටැබ්ලට් පරිගණකය)

01 පක්ෂීන් පිළිබඳ ගවේෂණය කරන අයෙකු විසින් පක්ෂීන්ගේ හඩ වාර්තාගත කිරීම, පරිසරයේදී ඡායාරූප ගැනීම සහ අදාළ දත්ත ඇතුළත් කිරීම

02 පුස්තකාලයක සාමාජික විස්තර පරිගණක ගත කිරීම සඳහා

03 එක්තරා වාණිජ බැංකුවක් විසින් වෙනත් ප්‍රදේශයක එම බැංකුවේම ශාඛාවක පවත්වාගෙන යන ගිණුමක විස්තර ගිණුම් හිමියකුට ලබා දීම.

04 සීගිරිය වෙත ගිය ක්ෂේත්‍ර චාරිකාවකදී සිසුන් හට අදාළ ස්ථානය පිළිබඳ විස්තර ඇතුළත් කර ගැනීම සඳහා

05 ජංගම අලෙවිකරුවකු වෙළඳසල්වලින් ඇණවුම් ලබා ගන්නා අවස්ථාවක් සඳහා

***** එම්.එල්.එච් ජයසේකර - ර/පැබොටුව මහා විද්‍යාලය *****